**කතරගම ප්‍රාදේශීය සභාව**

**මොණරාගල දිස්ත්‍රික්කය**

**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**---------------------------------**

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 18 වැනි දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජූලි 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජූලි 16 වැනි දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 මතය

**---------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට කතරගම ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වු මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

**--------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

**-----------------------**

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සභාවට අයත්ව තිබූ රු.2,340,000 ක් වටිනා කඩ කාමර 04 ක් 2008 පෙබරවාරි 26 දින සිට නාගරික සංවර්ධන අධිකාරිය සතුකරගෙන තිබුණද එම වත්කම් ගිණුම් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රු. 1,500,000 ක් වටිනා අංක 253-6345 දරන කැබ් රථය අනතුරට පත්වීම හේතුවෙන් රක්ෂණ සංස්ථාව විසින් කැබ් රථය පවරාගෙන රක්ෂණ වන්දි ලෙස රු.1,178,625 ක මුදලක් ගෙවා තිබුන ද එම කැබ් රථයේ වටිනාකම ගිණුම් වලින් ඉවත් කිරිමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු බිල් කල ආදායම රු. 1,480,369 ක් වුවද මූල්‍ය ප්‍රකාශන වල එය රු. 864,240 ක් ලෙස ගිණුම් ගත කිරීමෙන් රු. 616,129 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

## 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම.

(අ) බදුකරුවන් හදුනා නොගත් වෙළඳ ස්ථාන කුලී රු. 6,349,592 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දේශිය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතු එකතු කල අගය මත බදු රු.4,319,539 ක් සහ මුද්දර බදු රු.330,176 ක් සමාලෝචිත වර්ෂයේ දීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 85,774,941 ක වත්කම් විෂයන් 05 ක්, රු. 10,091,966 ක වගකීම් විෂයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණ කිරීමට නොහැකිවිය.

## 1.3.4 නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (1)(i) වගන්තියේ විධිවිධාන අනුව පළාත් පාලන කොමසාරිස්ගේ ලිඛිත පූර්ව අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී තාවකාලිකව ආදේශක හා ස්වේච්ඡා පදනම මත කම්කරුවන් 10 දෙනෙකු බඳවා ගෙන දල වැටුප්, සේවක අර්ථසාධක සහ සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් ලෙස රු.541,943 ක් ගෙවා තිබුණි.

## 2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

### 2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,197,295 ක් වූ අතර, ඊට ප්‍රතිරූපිව ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු. 89,796 ක් වුයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ ශුද්ධ වැඩිවීම රු. 1,287,091 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2.2.1 <u>වරිපනම් බදු</u>

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 140(5) වගන්තියේ විධිවිධාන අනුව 1997 වර්ෂයෙන් පසු වරිපනම් බදු ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 <u>සම්ප්‍රේෂණ කුළුණු ආදායම</u>

සමාලෝචිත වර්ෂයේ දී සම්ප්‍රේෂණ කුළුණු 06 කින් අයවිය යුතු බදු ආදායම 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 152 වගන්තියේ විධිවිධාන අනුව ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශ කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.3 <u>කඩ කාමර කුලි</u>

1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛ විධිවිධාන අනුව සභාව සතු කඩ කාමර කුලි තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.4 <u>වෙනත් ආදායම්</u>

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාර 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්යයක් සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියාපදිංචි කර ඇති හෝ එම අධිකාරිය අනුමත කර ඇති ප්‍රදේශී සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන හෝටල් 01 ක් සහ ලැගුම්හල් 06 කින් අදාළ වර්ෂයට පෙර වර්ෂයේ ලැබීම් වලින් සියයට එක නොඉක්මවන ගාස්තුවක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

සභාවේ ප්‍රවර්ථන වර්ෂයේ උසාවි දඩ හා මුද්දර ගාස්තු ගිණුම්ගත කරීමට කටයුතු කර නොතිබුණි.

2.2..6 හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂය අවසානයට එකතුව රු.27,411,857 ක් වු හිඟ ආදායම් 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 158 හා 159 වගන්තියේ විධිවිධාන අනුව අයකර ගෙන නොතිබුණි.

2.2.7 **අධිභාර**

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 172(3) වගන්තියේ විධි විධාන ප්‍රකාරව වගකිව යුතු අයවළුන්ට එරෙහිව මා විසින් ඉකුත් වර්ෂයන් තුළදී පනවන ලද අධිභාර සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.104,017 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

03. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විදුලිබල අමාත්‍යාංශ ලේකම්ගේ 2010 අගෝස්තු 17 දිනැති ලිපියේ 2(1) වගන්තිය ප්‍රකාරව වීථි ලාම්පු ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා ගාස්තු ගෙවීමේ පදනම මත පළාත් පාලන ආයතන වීථි පහන් ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සඳහා සේවා සැපයුම්කරුවකු ලෙස කටයුතු කල යුතු වුවත් එසේ සිදු නොකර සමාලෝචිත වර්ෂයේ දී මේ සඳහා සභා අරමුදලෙන් රු. 413,036 ක් වියදම් දරා තිබු අතර විථි ලාම්පු ස්ථාපනය කිරීමේදී ස්ථාපන ක්‍රමය, සවිකල යුතු ලාම්පු වර්ගය, සංඛ්‍යාව යන ආදිය පිළිබඳව විස්තර වාර්තාගත කර නොතිබුණි.

4. **<u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අභ්‍යන්තර පාලනය

(ඇ) ආදායම් පරිපාලනය